# වැවිලි අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

# තේ පර්යේෂණ මණ්ඩලය

## වතු වෛද්‍ය වෘත්තික තනතුර

## ශාන්ත කූම්බ්ස් වත්ත, තලවකැලේ

ඉහත තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**රැකියා විස්තරය**

ශාන්ත කූම්බ්ස්වත්තේ වතු අධිකාරිවරයාගේ මාර්ගෝපදේශ යටතේ දෛනික වෛද්‍ය අවශ්‍යතා සපුරාලමින් ඒ තුළින් සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් පවත්වා ගැනීම.

එසේම, සියලුම අදාළ ලේඛන පවත්වා ගනිමින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමග සෞඛ්‍ය සේවා සඳහා සම්බන්ධීකරණය කිරීමට හැකි විය යුතුය.

**අධ්‍යාපනික සුදුසුකම්**

අ.පො.ස. (සා/පෙළ) විභාගය ඉංග්‍රීසි සහ ගණිතය, අංක ගණිතය සහිතව සමත්ව සිටීම. (කර්මාන්තයේ පළපුරුද්ද සහිත අයවලුන් හට මෙම අවශ්‍යතාවය අදාළ නොවේ.)

හා

ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය සතු විය යුතුය.

**පළපුරුද්ද**

කනිෂ්ඨ වතු වෛද්‍ය සහකාර (JEMA) ලෙස වසර 4 ක පළපුරුද්ද තිබිය යුතුය.

**වැටුප් පරිමාණය :**

රුපියල් 32,320/- - 1,350 x 40 - රුපියල් 86,320/-

වාර්ෂික වැටුප් වර්ධකය - රුපියල් 1,350/-

**වයස් සීමාව :**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

මෙම තනතුර ස්ථිරය. තෝරා ගනු ලබන අයදුම්කරු, සේවා අවශ්‍යතා ප්‍රකාරව, තලවකැලේ ශාන්ත කූම්බ්ස් වත්තේ හෝ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය විසින් කළමනාකරණය කරනු ලබන වෙනත් ඕනෑම වත්තක සේවය කළ යුතුවේ.

අයදුම්පත්, සම්පූර්ණ ජීව දත්ත, උප්පැන්න සහතිකය, අදාළ අධ්‍යාපනික හා අනෙකුත් වෘත්තීය සුදුසුකම්වල සහතිකවල සේවා සහතිකවල පිටපත් සහිතව අයදුම්කරුගේ නිපුණතා හා අදාළ ක්ෂේත්‍රයේ දැනුම පිළිබඳ කරුණු විමසීම සඳහා ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග ලියාපදිංචි තැපැලෙන්, පහත සඳහන් අය වෙත **2020 ඔක්තෝබර් 26** වන දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

රාජ්‍ය සේවයේ/ සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුවේ. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන ලෙසට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවනු ඇත. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කරන්න.

තොරතුරු සඳහා, කරුණාකර අපගේ වෙබ් අඩවිය වන www.tri.lk වෙත යොමු වන්න.

**අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බ්ස්, තලවකැලේ.**